# ලංකාණ්ඩුවේ "ගැසට්" පත්‍රය.

ආණ්ඩුවේ අවසරයපිට ප්‍රසිද්ධකරණලදී.

අංක. 9,356—1945ක්වූ ජනවාරි මස 19 වෙනි දිනවූ සිකුරාදා.


## Part IV.—හතරවෙනි කාණ්ඩය.

### උපාංග නීති.

**වාරිමාර්ග ආඥාපනත 1917, අංක 45.**

වම් 1917 වේ අංක 45 දරණ ආඥාපනතේ 11 වැනි ව්‍යවස්ථාව යටතේ යටිකද, වැල්ලවාය, බුත්තල, උඩුකිද සහ විශාලව ඇති කෝරළයන්හි කුඹුරු අයිතිකරුවන් විසින් පිළිවෙලින් 1933 ඔක්තෝබර් 28 දින, 1933 නොවැම්බර් 14 දින, 1933 දෙසැම්බර් 9 දින, 1934 අප්‍රේල් 7 දින සහ 1934 අප්‍රේල් 9 දින පවත්වනලද රැස්වීම්වලදී බහුතර ඡන්දයෙන් සම්මතකරන ලද්දාවූද යටකී ආඥාපනතේ අංක 19 දරණ ව්‍යවස්ථාව යටතේ සහ ලංකා රාජ්‍ය මන්ත්‍රණ සභාව පිළිබඳ වූ 1931 රාජාඥාපනතේ 93 වැනි වගන්තිය යටතේ පැවරී ඇති බලයේ ප්‍රකාර ලංකාණ්ඩුකාර උතුමාණන්වහන්සේ විසින් ස්ථිරකරන ලද්දාවූද ව්‍යවස්ථාවෝ.

ඩී. ඇස්. සේනානායක,
කෘෂිකර්මාන්තය හා ඉඩම් පිළිබඳ අමාත්‍යතුමා.

අමාත්‍ය කාර්යාලය, කොළඹ,
1934 ජූලි 24.

1. සෑදීම සහ අළුත්වැඩියාකිරීම.—යම් කුඹුරු යායක් හෝ යායවල් ස්වල්පයක් වැඩකරීමට වතුර ගන්නා වැව, ඇල නොහොත් ඒ පිණිස ඇති වැඩ එයින් ප්‍රයෝජන ලබන කුඹුරු අයිතිකාරයන් හෝ ගොවියන් විසින් තමාට අයත් හෙවත් වැඩකරන බිම් ප්‍රමාණයට වැටෙන ප්‍රමාණයට සෑදීම සහ අළුත්වැඩියාකිරීම කළ යුතුයි. එසේම අමුණු සහ පෝරා පිළිබඳ වැඩ සිරිත් පරිදි සියලුම කුඹුරු අයිතිකාරයන් හෙවත් ගොවියන් විසින් පොදුවේ කළ යුතුයි.

2. යම් කුඹුරකට හෝ යායකට පමණක් විශේෂවූ නියරවල්, වේලි සහ ජලමාර්ගයන් එකී කුඹුරේ හෝ යායේ අයිතිකරුවන් හෙවත් ගොවියන් විසින්ම සෑදිය යුතුයි. අළුත්වැඩියාකළ යුතුයි.

3. ඉහත සඳහන් වැඩ (වැව්, අමුණු, පෝරා සහ ඇලවල්) සෑදීම සහ නිසි පිළිවෙලට පැවැත්වීම යන්නෙන් එකී ස්ථානවලට සහ යායවලට යන එන මංමාවත් සෑදීම සහ අළුත්වැඩියාකිරීමද අදහස් කෙරේ.

4. යම් යායක තිබෙන රජයේ සන්තක කුඹුරක් වෙනුවෙන් කළයුතු සියළු වැඩ එකී කුඹුර වැඩකරණ අය විසින් කළ යුතුයි. යම් හෙයකින් ඒ කුඹුර වැඩනොකර ඇරියා නම් ඒ සඳහා කළයුතු වැඩ ප්‍රමාණය ඒ යායේ සියලුම කුඹුරු අයිතිකාරයන් හෙවත් ගොවියන් විසින් පොදුවේ කළ යුතුයි.

5. වෙල් විදානේ විසින් නියමකරනලද දවසේදීද ඒව පසුවත් අවශ්‍ය වැඩ හරියාකාර ලෙස සහ සම්පූර්ණ ලෙස කිරීමට යම් දිනයන්හි අවශ්‍යද ඒ දිනවලදීද සියලු කුඹුරුකාරයන් හෙවත් ගොවියන් ඒ සඳහා අවශ්‍ය උපකරණයන් සපයාගෙන එක්රැස් වී තම තමන් විසින් කළයුතු වැඩ ඒ පිළිවලට නිසියාකාර කළ යුතුයි.

6. ඉහත සඳහන් පරිදි යම් වැඩක් සෑදීමේදී හෝ අළුත්වැඩියාකිරීමේදී, ඒ ඒ අය විසින් කළයුතු වැඩ ප්‍රමාණය වෙල් විදානේ විසින් නියමකර දිය යුතුයි.

7. මේ ව්‍යවස්ථාවන් යටතේ කළයුතු වැඩවලින් කිසිම කෙනෙකුට නිදහසක් කුඹුරු වැඩනොකර තිබීම හේතුකොට ගෙන නොලැබේ.

8. යම් කෙනෙකු කෙරෙහි පැවරෙන වැඩ කොටස ඒ අය විසින් නොකර පැහැරහැරියොත් එසේ නැතහොත් කිරීම ප්‍රතික්ෂේප කළහොත් වෙල් විදානේ විසින් ඒ වැඩ කොටස කුලියට මිනිසුන් යොදවා කළ යුතුයි. ඒ සඳහා දරනලද වියදම එකී අයගෙන් වාරිමාර්ග ආඥාපනතේ 65 වැනි වගන්තියෙන් දක්වා ඇති පරිදි අයකරගත යුතුයි.

9. පොරොන්දු පත්‍රයකින් හෝ වෙන අන් ක්‍රමයකින් ආණ්ඩුවේ ඒජන්තතුමාට ඒත්තුගන්නාකාර පෙන්වා සෑහීමට සැලැස්වූ හොත් ගොවියා විසින් වාස් කිරීම් පලාතේ සුවහින වාරිතුවලට එකතු නොවෙතොත් බැඳී ඇති කුඹුරු සඳහා මේ ව්‍යවස්ථාවන් යටතේ කළයුතු සියලුම යුතුකම් ඉෂ්ටකිරීමට කුඹුරු අයිති කාරයා බැඳිසිටී.

10. වතුර බෙදදීම.—යම්කිසි ඔයක හෝ වතුර පාරක අමුණු කීපයක් තිබේනම් පහත් අමුණුවලට කොපමණ වතුර දිය යුතුදැයි කෝරාළ විසින් නියමකළ යුතුයි.

11. යම්කිසි ප්‍රධාන ඇලක් යටතේ කුඹුරු යායවල් කීපයක් තිබේනම් ඇළේ විදානේ වෙල් විදානේවරු සමග සාකච්ඡාකොට එක එක යායට දියයුතු වතුර ප්‍රමාණය නියමකළ යුතුයි.

12. එයාම් යායට වතුර බෙදදීම එකී යායේ වෙල් විදානේ විසින් කළ යුතුයි.

13. වගායතක නොහොත් වස්කඩවල ප්‍රමාණය, කඩන ස්ථානය, ඒවායින් වතුර ගැලීමට ඇරගන්න වේලාව සහ කාලයද පැවති සිරිත්වලට එකඟව වෙල් විදානේගේ කැමැත්තේ ප්‍රකාරයට විය යුතුයි.

14. (අ) යම්කිසි වැවක ඇළක හෝ ඵල්පතක ජලය ප්‍රමාණ නොවෙතොත් සමස්ත ජල මාර්ගයට යටත් ඉඩම් අයිතිකරුවන්ගේ වැඩි ඡන්දයෙන් කවර ඉඩම් එළිකොට වගාකළ යුතුදැයි තීරණයකළ යුතුයි.

(ආ) මෙබඳු තීරණයකින් ස්වකීය අයිතිවාසිකම්වලට හානි පැමිණේයයි සලකන ඉඩම් අයිතිකරුවෙකුට ඒ තීරණයට විරුද්ධව ආණ්ඩුවේ ඒජන්තතුමාට සරණු සැලකර සිටිය හැක.

(ඉ) යම්කිසි හේතුවක් කාරණකොටගෙන ඉඩම් අයිතිකරුවන්ට තීරණයකට එළඹීමට අපහසුවූනිනම් ඒ කාරණය ආණ්ඩුවේ ඒජන්තතුමා වෙත ඉදිරිපත්කළ යුතුයි.

(ඊ) මේ පිළිබඳව ආණ්ඩුවේ ඒජන්තතුමාගේ තීරණය අවසාන තීරණයයි.

15. යම් කුඹුරු යායකට හෝ කුඹුරකට වතුර නියම වෙන පරිදි යම් ගොවියෙකුට හිමි වතුර කොටස නොලැබෙන පරිදි, වතුර අපතේ යන පරිදි, එසේ නැතහොත් කෙනෙකුට අවාසිවන කෙනෙකුට වාසිවෙන පරිදි කිසිම ක්‍රියාවක් කිසිවකු විසින් නොකළ යුතුයි.

16. යම් කුඹුරු යායකට හෝ කුඹුරකට ඒ, ඒ වාරවලට වතුර ගන්නා සිරිතක් පැවතිණිනම් ඒ සිරිත කිසිවක් නිසා කඩනොකළ යුතුයි.

17. කුඹුරු ගොවිතැන්කිරීම.—යම්කිසි වාරයකට ගොවිතැන් කිරීම සඳහා කුඹුරු පෝරුගෑම ඉක්බිති ඒ කුඹුරු යායේ සියළුම අයිතිකරුවන් එකවිටම කුඹුරු වැඩ පටන්ගත යුතුයි.

18. යායේ කුඹුරු අයිතිකරුවන්ගේ වැඩි ඡන්දයෙන් නියම කරගත් බිත්තර වී වර්ගයම ඒ යායේ වැපිරිය යුතුයි.

19. තෝරාගන්නාලද බිත්තර වී වර්ගය වපුරන්ට බැරිවූ ගොවියෙකුට යායේ අවශේෂ කුඹුරු අයිතිකරුවන් සිරිත් පරිදි කළයුතු උපකාරකිරීමෙන් නිදහස නොලැබේ. එමෙන්ම සිරිත් පරිදි අනෙක් ගොවියන්ගෙන් බලාපොරොත්තු වියයුතු ප්‍රමාණයට වඩා උපකාර ලැබීමටද අයිතිවාසිකමක් නැත.

20. එක එක යායට අවශ්‍ය වැටවල්, මුරපැලවල් බැඳීමට සහ පැවැත්වීමට උචිත වැඩ ප්‍රමාණය තමාට අයත් ඉඩමේ ප්‍රමාණයට කළ යුතුයි.

21. වපුරා වැට බැඳී කුඹුරු යායකට ගොනුන් සපා බේරා අවසානවනතුරු ගොවිතැනට අදාල සතුන් හැර සිය සත් කුනු ඇතුල්නොකළ යුතුයි.

22. යායේ සියලුම කුඹුරු කපා බේරා අවසන්වනතෙක් එකී යායේ සියලුම ගොවියන් විසින් තම තමාගේ යුතුකම් ඉෂ්ටකළ යුතුයි.

23. සාමාන්‍ය ව්‍යවස්ථා.—ආණ්ඩුවේ ඒජන්තතුමාගේ අනුමැතියක් හැර පැවති කුඹුරුවල වතුර ප්‍රමාණය කෙරෙහි බල පැවැත්වෙන පරිදි අලුත් වෙල් බැඳීමෙන් හෝ ඇලවල් සෑදීමෙන් අලුත් ඉඩම් අස්වැද්දීම හෝ වෙන කරුණකට වතුරගැනීම තහනම්ය.

24. විහාර දේවාලවලට අයත් කුඹුරු, භුක්තිවිඳින අය සහ නිලකාරයෝත් මේ ව්‍යවස්ථාවලට අනුව ක්‍රියාකළ යුතුයි.

25. මලන් කුඹුරු වැඩකිරීම ගැන මෙකී ව්‍යවස්ථාවල් යටතේ යම් පමණ ක්‍රියාකළ හැකිද එපමණට බලපාත් වේ.

26. හරකුන් දඩාවතේ හැරීමෙන් හෝ වෙන කුඹුරු කාරයෙකුගේ නොසැලකිල්ල හේතුකොටගෙන යම් කුඹුරක අස්වැන්නට හානියක් සිදුවුවහොත් ඒ හානිය වෙල්විදානේ සහ ඊට මැදහත්නැති අයවලුන් දෙදෙනෙකු විසින් හැකි ඉක්ම

අවස්ථාවලදීම වගඋත්තරකරු ඉදිරියේදී තක්සේරු කොට ඒ සඳහා ඇතිවෙන වියදමකදී පෙන්වීමට හැකිවන පරිදි තීරණය විස්තර අත්සන් කරනලද රෙපෝර්තුවක් පැමිණිලිකරුට දිය යුතුයි.

27. වැටවල් නොබැඳීමේ සිරිත පවතින ස්ථානවල කුඹුරු යායන්ට ඇතුළු වන ගවයන් දිගමිලිකල යුතුයි.

28. වාරිමාර්ග ආඥාපණතේ 21 වැනි වගන්තිය යටතේ වෙල් මුලාදෑනියකු උසාවියෙන් ඒ යායේ කුඹුරු අයිතිකරුවකු හෝ බොල්ලකු නොවන කිසිවකු පත් නොකල යුතුයි.

29. සියලුම වාරි කමිටුවල වෙල් මුලාදෑනීන් හෝ ඒ සඳහා පත් කරනලද අයකුත් මුලාදෑනීන්ගේ පාලනය යටතේ තිබිය යුතුයි. ඒ අය හැර අන්‍ය අයකු විසින් කරන අනවශ්‍ය මැදහත්වීම් සහ අප්‍රමාණවත් මේ ව්‍යවස්ථාවන් යටතේ වරදවල් ලෙස ගනු ලැබේ.

30. පත් කරනලද මුලාදෑනියා තමා භාරයේ ඇති සියලුම වාරි කමිටු සම්බන්ධ කඳපලවලට වගකිය යුතුයි.

31. එක එක වාරි කමිටුවක් යටතේ ඇති කුඹුරු, අයිතිකරුවන්ගේ සහ ඒ ඒ අයට අයත් වපසරිය දක්වන ලැයිස්තුවක් පිළියෙල කර වෙල් විදානේ ලඟ තබාගත යුතුයි. මෙය අවුරුදු පතා අලුත්කල යුතුයි.

32. පහත දැක්වෙන ප්‍රමාණයේ පරිදි ගොවිතැන් කරණ ලද කුඹුරුවලින් "හුවන්දිරම" බද්ද අයකරගත හැකිය.

මුත්තල, වැල්ලවාය, වී අමුණෙට කුරුණි 4යි.

ගුබ්කිද, යටිකිද සහ සියලුම වී අමුණට කුරුණි 2½.

33. ප්‍රධාන ඇලකින් වතුර ලබාගන්නා කුඹුරු යායවල වෙල් විදානෙවරු ප්‍රධාන ඇලේ කටයුතු සම්බන්ධව ඇලේ විදානේගේ උපදෙස් පරිදි කටයුතු කල යුතුයි. ඔවුන් විසින් ලබාගන්නා හුවන්දිරම් බද්දෙන් ¼ ඇලේ විදානේට ගෙවිය යුතුයි.

34. ඒජන්තතුමාගේ හෝ බලයලත් අන්‍ය මුලාදෑනියකුගේ අවසරය නොමැතිව වී නොවිතැනට හැර අන්‍ය කටයුත්තක් සඳහා වාරි කමිටුවකින් වතුර නොගත යුතුයි.

35. ප්‍රධාන ඇලෙන් වතුර ගෙනයාම සඳහා උප ඇලවල් අවශ්‍යවුනිමට තමාගේ කුඹුරු මැදින් වැටී ඇති ඇලේ කොටස වෙල් විදානේගේ උපදෙස් පරිදි තමා විසින් කැපිය යුතුයි.

36. සපිකිද, වැල්ලවාය, මුත්තල, උබ්කිද සහ සියලුම යන කෙටම් සඳහා සම්පාදිත වූ 1895 සැප්තැම්බර් 27 වෙනි දින ආණ්ඩුවේ ගැසට් පත්‍රයේ පලකරනලද වාරිමාර්ග ආඥාපණතේ අංක 2 දරන වගන්තිය යටතේ මෙතෙක්කල් වලංගුව පැවති ව්‍යවස්ථාවන් මෙයින් අවලංගු කලා ඇත.

---

## ආණ්ඩුවේ ඉඩම් විකිණීම හෝ බදුදීම සඳහා දැන්වීම.

**No. 13,889, S. O.**—ඉඩම් නිරවුල්කිරීමේ නිලධාරිතුමා විසින් මෙහි පහත සඳහන්වෙන ආණ්ඩුව සන්තක ඉඩම් ආණ්ඩුවේ නියෝගවල ප්‍රකාරයව එම 1945ක්වූ මාර්තු මස 19වෙනි දිනවූ සඳුදා පෙරවරු 10ට නාගල්ලේ කච්චේරියේදී වෙන්දේසිකර විකුණන්ට හෝ බේරුම්කරන්දෙන්ට නොහොත් වෙන අන්දමකින් තීන්දුකරන්ට යෝජනාවා ඇත. වයඹ දිසාවේ කුරුණෑගල දිස්ත්‍රික්කේ වැඩබිම් හත්පත්තුවේ හේවාවිස්ස කෝරලේ පිහිටා තිබෙන බිම් කැබලි 8ක්.

ලංකාමැනීමේ මුල් පිඹුරේ නො. 2,479. ගම—මොරතිහ ගබඩාගම.

| නො. | ඉඩමේ නම. | ඉල්ලුම්කාරයා හෝ අයිතිකාරකියන්නා. | අන්දම. | මහත, අ. රූ. ප. |
|---|---|---|---|---|
| 26A | ගල්වලගෙහේන, හුනුපොල කන්දේවත්තමුකලාන | (1) වානදුරදේවයලාගේ රන්කිරා, (2) එම හන්දුවා, (3) එම හැරෙනියා, (4) එම නයිදා, (5) එම පොඩිසිංඤෝ, (6) හෙවිටි වානදුරදේවයලාගේ පිනරි, (7) එම පිලිනා, (8) එම පරණපාල, (9) එම මතිස්, (10) එම පජමන්, (11) වානදුරදේවයලාගේ සලින්දු, (12) එම කිරි, (13) එම බිල්ලන්ද, (14) එම රිදෙජ්නා, (15) එම බාබාසිනා, (16) එම සිමන්, (17) එම පබිලිනා | හේන | .. 0 2 0 |
| 27C | කොස්වත්තෙහේන .. | (1) රම්මුඅදේවයලාගේ පනා, (2) එම පුනචා .. | එම | .. 2 2 7 |
| 27E | කප්පරවල්ලිගේහේන, කොස්මත්තේහේන, ගල්ලෑහේහේන | ලොට් නො. 26Aට අයිතිකාරකියන අයයි .. .. | එම | .. 3 2 0 |
| 27F | පුහුකොස්ගහමුලහේන .. | (1) වානදුරදේවයලාගේ බන්ඩිය නොහොත් පියසේන, (2) උඩත්තපොල පදිංචි එම උන්ගු නොහොත් බිස්සිරි, (3) මොරතිහ විහාරගම පදිංචි එම මාසි, (4) එම විකිරි, (5) එම හදුවා | එම | .. 2 0 19 |
| 27G | ගල්පිලේහේන, දික්හේන | (1) රම්මුඅදේවයලාගේ පිනා, (2) එම පියවා, (3) වානදුරදේවයලාගේ පුංචි | එම | .. 2 2 13 |
| 27L | රුක්අත්තනගහමුලහේන | රම්මුඅදේවයලාගේ බිසුවා .. .. .. | එම | .. 4 3 17 |
| 79 | කහටගහමුලහේන .. | (1) මොරතිහ විහාරගම පදිංචි වානදුරදේවයලාගේ රන්කිරාගේ උරුමක්කාරයෝ, (2) එම එම හැරෙනියා .. .. | හේන සහ පුවක් | 2 0 1 |
| 129A | අත්කුඹුරහේන .. | (1) මොරතිහ විහාරගම පදිංචි වානදුරදේවයලාගේ රන්කිරාගේ උරුමක්කාරයෝ, (2) එම හන්දුවා, (3) ගබඩාගම පදිංචි රම්මුඅදේවයලාගේ බන්ඩියා | හේන | .. 2 3 35 |

තක්සේර, මිල අක්කරයක් රුපියල් 100කට වැඩිනොවන මුදලක්වේ.

මෙකී ඉඩම් ගැන වැඩිදුර තොරතුරු කොල්ලුපිටියේ ඉඩම් බේරුම්කරන නිලධාරිතුමාගෙන්ද, ඒවායේ පිඹුරු කොළඹ සර්වේයර් ජනරාල් උන්නාන්සේගෙන්ද ලබාගත හැකිවේ.

එම 1945ක්වූ ජනවාරි මස 13වෙනි දින බම්බලපිටියේ ඉඩම් පිළිබඳ කොමසාරිස් උන්නාන්සේගේ කන්තෝරුවේදිය.

එච්. ඊ. ජේම්ස්,
ඉඩම් පිළිබඳ කොමසාරිස් උන්නාන්සේ වෙනුවට.

---

**No. 13,890, S. O.**—ඉඩම් නිරවුල්කිරීමේ නිලධාරිතුමා විසින් මෙහි පහත සඳහන්වෙන ආණ්ඩුව සන්තක ඉඩම් ආණ්ඩුවේ නියෝගවල ප්‍රකාරයට එම 1945ක්වූ මාර්තු මස 16වෙනි දිනවූ සිකුරාදා පෙරවරු 10ට නාගල්ලේ කච්චේරියේදී වෙන්දේසිකර විකුණන්ට හෝ බේරුම්කරන්දෙන්ට නොහොත් වෙන අන්දමකින් තීන්දුකරන්ට යෝජනාවා ඇත. වයඹ දිසාවේ කුරුණෑගල දිස්ත්‍රික්කේ වැඩබිම් හත්පත්තුවේ මදුරේ කෝරලේ පිහිටා තිබෙන බිම් කැබලි 28ක්.

ලංකාමැනීමේ මුල් පිඹුරේ නො. 838. ගම—මහවෙල.

| නො. | ඉඩමේ නම. | ඉල්ලුම්කාරයා හෝ අයිතිකාරකියන්නා. | අන්දම. | මහත, අ. රූ. ප. |
|---|---|---|---|---|
| 40B | සේරුගහරුප්පේ .. | සින්හලපෙඩිදුරයලාගේ සහන්දු .. .. | හේන | .. 1 0 5 |
| 40C | එම .. | එම අම්මා .. .. .. | එම | .. 1 0 4 |
| 40E | එම .. | හතුරුසිංහපෙඩිගේ කිරිහාදුවා .. .. | එම | .. 1 0 3 |
| 85 | අලපලවෙවත්ත .. | රත්නායකපෙඩිදුරයලාගේ කිරා .. .. | පොල්වත්ත | .. 0 0 36 |
| 101 | පනඹරේවත්ත .. | (1) සිංහපෙඩිදුරයලාගේ ගුනන්දරි, (2) එම කිරිදුරයා, (3) එම උක්කු | එම | .. 0 2 1 |
| 103 | එම .. | (1) ඉලන්දාරිපෙඩිදුරයලෑ පුලි, (2) හතුරුසිංහපෙඩිදුරයලෑ කිරිහාදුවා, (3) මුතුහැන්දුරයලෑ පින්චිදුරයා | එම | .. 1 0 16 |
| 104 | බෝගහමුලවත්ත .. | එම .. .. .. | එම | .. 0 0 12 |
| 105D | කොත්තගහමුලහේන. | මෙරගල්පෙඩිදුරයලාගේ සිරි .. .. .. | හේන | .. 1 0 5 |
| 105E | මිල්ලගහමුලවත්ත .. | එම උක්කු .. .. .. | පොල්වත්ත | .. 0 2 0 |
| 105F | ගොන්නගහමුලහේන | (1) රත්නායකපෙඩිදුරයලාගේ හපු, (2) එම කුඩාදුරයා, (3) එම එහන්දි | හේන | .. 1 0 0 |
| 105H | බෝගහමුලහේන .. | ඉලන්දාරිපෙඩිදුරයලාගේ පුලි .. .. .. | එම | .. 2 0 0 |
| 105I | පිත්තකොලතැන්හේන | එම පනලගෙදර ඇව්වී .. .. .. | එම | .. 1 0 3 |
| 105J | එම .. | සිංහපෙඩිදුරයලාගේ සහන්දි .. .. | එම | .. 0 3 3 |
| 105K | එම .. | (1) දසනායකමුදියාන්සේලාගේ විජේරත්න බන්ඩා, (2) එම සිත්තිරි අම්මා | එම | .. 3 0 5 |

| නො. | ඉඩමේ නම. | ඉල්ලුම්කාරයා හෝ අයිතිකම්කියන්නා | අන්දම. | මහත, අ. | රූ. | ප. |
|---|---|---|---|---|---|---|
| 105L | බෝගහමුලහේන .. | රන්කොත්පේඩිදුරයලාගේ තොෂිතලා .. .. | හේන .. | 0 | 3 | 3 |
| 105O | එම .. | ඉද්දමල්වීරයලාගෙදර නෙරු .. .. .. | එම සහ පොල් වත්ත | 0 | 2 | 0 |
| 105Q | බෝගහවලහේන .. | (1) සිංහපේඩිදුරයලාගේ පතම්බරගෙදර කුඩාදුරයා, (2) ඉලන්දරී පේඩිදුරයලාගේ කළු, (3) එම ගුණෙන්දරී, (4) එම පුලි | ඩුම්කොල .. | 0 | 2 | 24 |
| 105R | එම .. | (1) රන්කොත්පේඩිදුරයලාගේ කිරියා, (2) එම පුන්චි, (3) එම මෙනිකා, (4) එම ඒසන්දි | හේන .. | 1 | 0 | 6 |
| 105S | පනඹරේහේන .. | (1) රන්කොත්පේඩිදුරයලාගේ හපු, (2) එම කුඩාදුරයා, (3) එම ඒසන්දි | හේන සහ පොල් ඉඩම | 2 | 0 | 5 |
| 105T | එම .. | (1) සිංහලපේඩිදුරයලාගේ පින්චා, (2) එම ගුණෙන්දරී, (3) එම කිරිදුරයා | එම .. | 0 | 2 | 3 |
| 105U | එම .. | (1) රන්කොත්පේඩිදුරයලාගේ කිරියා, (2) එම පුන්චි, (3) එම මෙනිකා, (4) එම ඒසන්දි | හේන .. | 0 | 2 | 3 |
| 105W | එම .. | (1) ඉලන්දරීපේඩිදුරයලාගේ කිරිදුරයා, (2) එම ඒසන්දි, (3) එම කළු, (4) එම ගුණෙන්දරී, (5) එම පුලි | එම .. | 1 | 0 | 4 |
| 111C | අලපලවේහේන .. | එම ඩිංගරි .. .. .. .. | එම .. | 0 | 1 | 39 |
| 111D | එම .. | සක්කරපේඩිදුරයලාගේ හපුනා .. .. | එම .. | 0 | 0 | 39 |
| 111F | එම .. | රන්කොත්පේඩිදුරයලාගේ කිරා .. .. | එම .. | 0 | 0 | 39 |
| 111G | ඔබවත්තේහේන .. | ඇල්ලේගොඩගෙදර රන්කොත්පේඩිදුරයලාගේ අරුම්බා .. | එම .. | 1 | 0 | 38 |
| 112 | ගොඩපැද්දයහේන | සක්කරපේඩිදුරයලාගේ පිනී .. .. .. | පොල්වත්ත .. | 0 | 1 | 17 |
| 146 | ඇල්හේන .. | රන්කොත්පේඩිදුරයලාගේ අබද්ද වෙල්දුරයා .. .. | හේන .. | 2 | 2 | 39 |

තක්සේරු මිල අක්කරයක් රුපියල් 100කට වැඩි නොවන මුදලක් වේ.

මෙකී ඉඩම් ගැන වැඩිදුර තොරතුරු කොල්ලුපිටියේ ඉඩම් බේරුම්කරන නිලධාරීතුමාගෙන්ද, ඒවායේ සිතියම් කොළඹ සර්වේයර් ජනරල් උන්නාන්සේගෙන්ද ලබාගත හැකිවේ.

මේ 1945 ක්වූ ජනවාරි මස 13 වෙනි දින බම්බලපිටියේ ඉඩම් පිළිබඳ කොමසාරිස් උන්නාන්සේගේ කන්තෝරුවේදීය.

එච්. ඊ. ජෑන්ස්,
ඉඩම් පිළිබඳ කොමසාරිස් උන්නාන්සේ වෙනුවට.

---

**No. 13,891, S. O.**—ඉඩම් නිරවුල්කිරීමේ නිලධාරීතුමා විසින් මෙහි පහත සඳහන්වෙන ආඥාව සන්තක ඉඩම් ආඥාවේ නියෝගවල ප්‍රකාරයට මේ 1945 ක්වූ මාර්තු මස 17 වෙනි දිනවූ සෙනසුරාදා පෙරවරු 10ට නාහල්ලේ කුඩාරමේදී වෙන්දේසි කර විකුණන්ට හෝ බේරුම්කරදෙන්ට නොහොත් වෙන අන්දමකින් තීන්දුකරන්ට යෙදෙනවා ඇත. වයඹ දිසාවේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ වැලඹිලි හත්පත්තුවේ මැදුරේ කෝරළේ පිහිටා තිබෙන බිම්කැබලි 15ක්.

ලංකාමැනීමේ මුල් සිතියමේ නො. 816. ගම—පිහිම්බුව.

| නො. | ඉඩමේ නම. | ඉල්ලුම්කාරයා හෝ අයිතිකම්කියන්නා. | අන්දම. | මහත. අ. | රූ. | ප. |
|---|---|---|---|---|---|---|
| 7 | මහදරපොතවත්ත .. | වී. ඇම්. මීරා සායිබු .. .. .. | පොල්වත්ත | 4 | 2 | 2 |
| 9 | මහදරපොතහේන .. | එම .. .. .. | හේන .. | 0 | 2 | 31 |
| 11 | මහදරපොතවත්ත .. | එම .. .. .. | පොල්වත්ත | 0 | 2 | 38 |
| 19 | මුත්තේහේපිල්ලෑව .. | (1) මල්ගේ පදිංචි මල්ගේඋඩගෙයවත්තේ පුන්චි මෙනිකේ, (2) එම එම සිමන් මෙනිකේ, (3) පිහිම්බුවේ පදිංචි හින්නරගෙදර රත්තරංඅප්පු | එම .. | 0 | 2 | 3 |
| 21 | ඉරක්පිටියේවත්ත .. | ජිනාබුකන්දේලෑගෙදර හල්බිදුනුඇල්ලේගෙදර සිලින්දු .. | එම .. | 0 | 2 | 13 |
| 23 | එම .. | ලොට් නො. 19ට අයිතිකම්කියන අය මෙති .. .. | වත්ත .. | 0 | 0 | 10 |
| 34 | මෙබේරිගේහේවත්ත .. | මියනදෙනියේ පදිංචි දසනායකමුදියන්සේලාගේ විජයරත්න බණ්ඩා | පොල්වත්ත | 1 | 1 | 5 |
| 41 | උඩගෙදරවත්ත .. | රඹේබොඩගල්ලේ පත්තොල්ලේ රබර්වත්තේ කරුප්පන් කන්කානිගේ උරුමක්කාරයෝ | එම .. | 0 | 3 | 11 |
| 53 | ඉහලගෙදරවත්ත නොහොත් ගැටිසීවත්ත | (1) මියනදෙනියේ පදිංචි දසනායකමුදියන්සේලාගේ විජයරත්න බණ්ඩා, (2) කර්දගේකෝරළේ මීගොල්ලේ පදිංචි එම ගුණවතී මියනදෙනිය, (3) එම එම ජයරත්න බණ්ඩා මියනදෙනිය | එම .. | 1 | 2 | 35 |
| 80 | සියඹලාගොඩැල්ලේහේන නොහොත් කෝන්ගහකොටුවේපිල්ලෑව නොහොත් මිල්ලගහදරපොත | (1) වෑගම පදිංචි කන්දපොල වලව්වේ සුරංජිත අභයනායක බණ්ඩි මුදියන්සේලාගේ සෙනෙවි රත්න, (2) සුරංජිත වර්ණසිංහ අභයනායකමුදියන්සේලාගේ සෝමවතී කුමාරිහාමි | හේන .. | 0 | 2 | 33 |
| 88 | අරාවිටපිටියේහේන .. | පිහිම්බුවේ පදිංචි තැන්නකෝන්මුදියන්සේලාගේ පුන්චි බණ්ඩා .. | පොල්වත්ත | 1 | 0 | 17 |
| 102 | සියඹලාගොඩැල්ලේහේන | එම එම ඩිංගිරිඅම්මා .. .. .. | හේන සහ පොල්වත්ත | 0 | 0 | 32 |
| 103 | සියඹලාගොඩැල්ලේවත්ත | එම .. .. .. | පොල්වත්ත | 0 | 1 | 29 |
| 110 | මුත්හේන .. | (1) අදිකාරිමුදියන්සේලාගේ අප්පුහාමි, (2) එම උක්කුබණ්ඩා, (3) අදිකාරිමුදියන්සේලාගේ පිකිරි බණ්ඩා, (4) ඩිංගිරි අම්මා නොහොත් බණ්ඩි මැණිකා | හේන .. | 0 | 3 | 21 |
| 123 | කොහිල්ලගොඩැල්ලේ හේන | හිරියාල හත්පත්තුවේ උඩනම්මිට පදිංචි දසනායකමුදියන්සේලාගේ ඩිංගිරි බණ්ඩා | එම .. | 0 | 2 | 8 |

තක්සේරු මිල අක්කරයක් රුපියල් 100කට වැඩි නොවන මුදලක් වේ.

මෙකී ඉඩම් ගැන වැඩිදුර තොරතුරු කොල්ලුපිටියේ ඉඩම් බේරුම්කරන නිලධාරීතුමාගෙන්ද, ඒවායේ සිතියම් කොළඹ සර්වේයර් ජනරල් උන්නාන්සේගෙන්ද ලබාගත හැකිවේ.

මේ 1945 ක්වූ ජනවාරි මස 1[illegible] වෙනි දින බම්බලපිටියේ ඉඩම් පිළිබඳ කොමසාරිස් උන්නාන්සේගේ කන්තෝරුවේදීය.

එච්. ඊ. ජෑන්ස්,
ඉඩම් පිළිබඳ කොමසාරිස් උන්නාන්සේ වෙනුවට.

---

**No. 13,892, S. O.**—ඉඩම් නිරවුල්කිරීමේ නිලධාරීතුමා විසින් මෙහි පහත සඳහන්වෙන ආඥාව සන්තක ඉඩම් ආඥාවේ නියෝගවල ප්‍රකාරයට මේ 1945 ක්වූ මාර්තු මස 17 වෙනි දිනවූ සෙනසුරාදා පෙරවරු 10ට නාහල්ලේ කුඩාරමේදී වෙන්දේසි කර විකුණන්ට හෝ බේරුම්කරදෙන්ට නොහොත් වෙන අන්දමකින් තීන්දුකරන්ට යෙදෙනවා ඇත. වයඹ දිසාවේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ වැලඹිලි හත්පත්තුවේ මැදුරේ කෝරළේ පිහිටා තිබෙන බිම්කැබලි 4ක්.

ලංකාමැනීමේ මුල් සිතියමේ නො. 819. ගම—ගෝනිගොඩ.

| නො. | ඉඩමේ නම. | ඉල්ලුම්කාරයා හෝ අයිතිකම්කියන්නා. | අන්දම. | මහත, අ. | රූ. | ප. |
|---|---|---|---|---|---|---|
| 58 | ඔදනවෙල්වත්ත .. | (1) ගෝනිගොඩ පදිංචි තෙන්නකෝන්මුදියන්සේලාගේ ඩිංගිරි බණ්ඩා, (2) එම එම බිසෝමැණිකා | පොල්වත්ත .. | 0 | 0 | 24 |
| 101 | ලෙඹඩපිටියේහේන, ජකලිගේ පිල්ලෑවේහේන | අත්කඹුරේ හැදිනියේ ජයගුරු ගුරුපති පදිංචි වී. ඇම්. මීරාසයිබු මරික්කාර් හජ්ජියාර් | හේන .. | 1 | 1 | 11 |
| 109 | ඉහලවලවේවත්තේ හේන | මියනදෙනියේ පදිංචි දසනායකමුදියන්සේලාගේ ඩිංගිරිඅම්මා .. | පොල්වත්ත සහ කුඹුර | 1 | 1 | 17 |

| නො. | ඉඩමේ නම. | ඉල්ලුම්කාරයා හෝ අයිතිකාරයෙකියන්නා. | අන්දම. | මහත, අ. රූ. ප. |
|---|---|---|---|---|
| 111 | කොකන්නගේහේන .. | හාරිස්පත්තුවේ ගල්හින්නේ පදිංචි (1) හෙගිරත්නමුදියන්සේලාගේ පිකිරි බන්ඩා, (2) අඹකොලගෙදර කාසිලෙබ්බෙ, (3) එම සාලිහුලෙබ්බෙ, (4) කොටගෙදර පදිංචි වර්නකුල ජයසූරිය මුදියන්සේලාගේ සිම්යොන් | හේන | .. 1 0 6 |

තක්සේරු මිල අක්කරයක් රුපියල් 100කට වැඩිනොවන මුදලක් වේ.

මෙකී ඉඩම් ගැන වැඩිදුර තොරතුරු කොල්ලුපිටියේ ඉඩම් බේරුම්කරන නිලධාරීතුමාගෙන්ද, ඒවාගේ සිතියම් කොළඹ සර්වේයර් ජනරල් උන්නාන්සේගෙන්ද ලබාගත හැකිවේ.

මේ 1945ක්වූ ජනවාරි මස 13වෙනි දින බම්බලපිටියේ ඉඩම් පිළිබඳ කොමසාරිස් උන්නාන්සේගේ කන්තෝරුවේදීය.

එච්. ඊ. ජූන්ස්,
ඉඩම් පිළිබඳ කොමසාරිස් උන්නාන්සේ වම්හ.

---

No. 13,893, S. O.—ඉඩම් නිරවුල්කිරීමේ නිලධාරීතුමා විසින් මෙහි පහත සඳහන්වෙන ආඥාව සහතක ඉඩම් ආඥාවේ නියෝගවල ප්‍රකාරයට මේ 1945ක්වූ මාර්තු මස 17වෙනි දනවූ සෙනසුරාද පෙරවරු 10ට නාගල්ලේ කුඩාරමේදී වෙන්දේසිකර විකුණන්ට හෝ බේරුම්කරදෙන්ට නොහොත් වෙන අන්දමකින් තීන්දුකරන්ට යෝදනවා ඇත. වයඹ දිසාවේ කුරුණෑගල දිස්ත්‍රික්කේ වැඋඩවිලි හත්පත්තුවේ මදුරේ කෝරලේ පිහිටා තිබෙන බිම්කැබලි 7ක්.

ලංකාමැනීමේ මුල් සිතියමේ නො. 813 ගම—වල්ලෙව.

| නො. | ඉඩමේ නම. | ඉල්ලුම්කාරයා හෝ අයිතිකාරයෙකියන්නා. | අන්දම. | මහත, අ. රූ. ප. |
|---|---|---|---|---|
| 10 | නාවලෙන්වත්ත .. | රත්නායකමුදියන්සේලාගේ හීන්බන්ඩා .. .. | පොල්වත්ත | .. 0 1 0 |
| 91 | ගලගාවාකොටුවේ හේන | එම සහ තවතත් අය .. .. .. | හේන | .. 0 0 13 |
| 92 | දෙකිදහේන, මහිවෙල් යායේහේන | (1) හොරොන්ගෙදර පුංචිරත්නායකමුදියන්සේලාගේ හීන්බන්ඩා, (2) ගල්කැටියගෙන්දෙන්දේවයලාගේ හවිතෙන්ද, (3) විජේරතොබයලාගේ අප්පුරා | හේන සහ පොල් ඉඩම | 2 0 8 |
| 96 | කොටුලාපිටියේහේන | එම .. .. .. | හේන | .. 0 0 36 |
| 99 | ඊරියගස්පිටියේපිලෑව | (1) සින්හලප්පිඩ්ඩුරයලාගේ පිකිරියා, (2) මුහින්දේවත්තේ පුංචා වෙල්දුරයා, (3) ඇස්. මුත්තුවා | හේන සහ කුඹුර | 0 2 11 |
| 109 | කම්මලවත්ත .. | උඩවත්තේගෙදර කලුහාමිනේ .. .. .. | පොල්වත්ත | .. 0 2 0 |
| 111 | වෙලැන්දේවත්ත .. | (1) දසනායකමුදියන්සේලාගේ මුදියන්සේ බන්ඩා, (2) රත්නායක මුදියන්සේලාගේ හීන්බන්ඩා | එම | .. 0 0 21 |

තක්සේරු මිල අක්කරයක් රුපියල් 100කට වැඩිනොවන මුදලක් වේ.

මෙකී ඉඩම් ගැන වැඩිදුර තොරතුරු කොල්ලුපිටියේ ඉඩම් බේරුම්කරන නිලධාරීතුමාගෙන්ද, ඒවාගේ සිතියම් කොළඹ සර්වේයර් ජනරල් උන්නාන්සේගෙන්ද ලබාගත හැකිවේ.

මේ 1945ක්වූ ජනවාරි මස 13වෙනි දින බම්බලපිටියේ ඉඩම් පිළිබඳ කොමසාරිස් උන්නාන්සේගේ කන්තෝරුවේදීය.

එච්. ඊ. ජූන්ස්,
ඉඩම් පිළිබඳ කොමසාරිස් උන්නාන්සේ වම්හ.

---

No. 13,894, S. O.—ඉඩම් නිරවුල්කිරීමේ නිලධාරීතුමා විසින් මෙහි පහත සඳහන්වෙන ආඥාව සහතක ඉඩම් ආඥාවේ නියෝගවල ප්‍රකාරයට මේ 1945ක්වූ මාර්තු මස 19වෙනි දිනවූ සඳුදා පෙරවරු 10ට නාගල්ලේ කුඩාරමේදී වෙන්දේසිකර විකුණන්ට හෝ බේරුම්කරදෙන්ට නොහොත් වෙන අන්දමකින් තීන්දුකරන්ට යෝදනවා ඇත. වයඹ දිසාවේ කුරුණෑගල දිස්ත්‍රික්කේ වැඋඩවිලි හත්පත්තුවේ මදුරේ කෝරලේ පිහිටා තිබෙන බිම්කැබලි 11ක්.

ලංකාමැනීමේ මුල් සිතියමේ නො. 2,627. ගම—වලව්වත්ත.

| නො. | ඉඩමේ නම. | ඉල්ලුම්කාරයා හෝ අයිතිකාරයෙකියන්නා. | අන්දම. | මහත, අ. රූ. ප. |
|---|---|---|---|---|
| 2 | දෙහිගගමුලහේන .. | ගල්හින්නේ පදිංචි අදපලයාගෙදර ඔමරුලෙබ්බෙ හජ්ජියාර්ගේ පුතාවන මොහමිදු කාසිම් ලෙබ්බෙ | හේන | .. 0 2 22 |
| 2A | එම | ලංකාහල්ලෙන්නයාලාගේ කුඩාහේනයා .. .. | එම | .. 0 2 6 |
| 2B | එම | නොම්බර 2කේ බිම්කපිටියට අයිතිවාසිකම්කියන අයවලුන්ය .. | එම | .. 1 0 0 |
| 2C | යැලේදින්නයාවත්ත .. | තුබගේගෙදර සුරුදා .. .. .. | එම | .. 0 3 12 |
| 2D | දෙහිගමුලහේන .. | ඉහලගොඩපාලගල්කැටියගේහේන්දේවයාලාගේ නයිදේ සහ තවත් අය | එම | .. 1 0 16 |
| 2E | වනගල්හේන .. | දිසානායකමුදියන්සේලාගේ මුතුබන්ඩා, මුතුමැනිකා සහ තවත් අය | එම | .. 0 3 25 |
| 2F | එම .. | විජේකෝන්මුදියන්සේලාගේ හීන්බන්ඩා, (2) හන්ගිලිගුරුන්නෑගෙලාගෙදර ගෙත්තප්පු | එම | .. 1 1 10 |
| 2G | එම .. | දිසානායකමුදියන්සේලාගේ මුතුමැනිකා සහ තවත් අය .. | එම | .. 0 0 12 |
| 2H | එම .. | එම මුතුබන්ඩා .. .. .. | රබර් | .. 1 0 7 |
| 18 | පිච්චනයිදේගේ හේන, ඇස්පොත | අනුගස්මුදියන්සේලෑලාගේගෙදර කලුබන්ඩා .. | හේන | .. 0 2 0 |
| 18A | ඇස්පොත, ගලපිට පිල්ලෑව .. | දිසානායකමුදියන්සේලාගේ මුතුබන්ඩා, (2) එම මුතුමැනිකා, (3) එම කලුබන්ඩා, (4) එම හිංගිරි මැනිකා, (5) එම පුංචිමැනිකා | හේන සහ කුඹුර .. | 1 0 37 |

තක්සේරු මිල අක්කරයක් රුපියල් 100කට වැඩිනොවන මුදලක් වේ.

මෙකී ඉඩම් ගැන වැඩිදුර තොරතුරු කොල්ලුපිටියේ ඉඩම් බේරුම්කරන නිලධාරීතුමාගෙන්ද, ඒවාගේ සිතියම් කොළඹ සර්වේයර් ජනරල් උන්නාන්සේගෙන්ද ලබාගත හැකිවේ.

මේ 1945ක්වූ ජනවාරි මස 13වෙනි දින බම්බලපිටියේ ඉඩම් පිළිබඳ කොමසාරිස් උන්නාන්සේගේ කන්තෝරුවේදීය.

එච්. ඊ. ජූන්ස්,
ඉඩම් පිළිබඳ කොමසාරිස් උන්නාන්සේ වම්හ.

---

No. 13,895, S. O.—ඉඩම් නිරවුල්කිරීමේ නිලධාරීතුමා විසින් මෙහි පහත සඳහන්වෙන ආඥාව සහතක ඉඩම් ආඥාවේ නියෝගවල ප්‍රකාරයට මේ 1945ක්වූ මාර්තු මස 20වෙනි දිනවූ අඟහරුවාදා පෙරවරු 10ට නාගල්ලේ කුඩාරමේදී වෙන්දේසිකර විකුණන්ට හෝ බේරුම්කරදෙන්ට නොහොත් වෙන අන්දමකින් තීන්දුකරන්ට යෝදනවා ඇත. වයඹ දිසාවේ කුරුණෑගල දිස්ත්‍රික්කේ වැඋඩවිලි හත්පත්තුවේ මදුරේ කෝරලේ පිහිටා තිබෙන බිම්කැබලි 2ක්.

ලංකාමැනීමේ මුල් සිතියමේ නො. 821 ගම—වලගම.

| නො. | ඉඩමේ නම. | ඉල්ලුම්කාරයා හෝ අයිතිකාරයෙකියන්නා. | අන්දම. | මහත, අ. රූ. ප. |
|---|---|---|---|---|
| 93 | කැකුලවෙල්පිල්ලෑව, නාරන්ගහන්ගේපිලලෑව | වලගම පදිංචි එදිරිසිංහමුදියන්සේලාගේ නොහොත් බස්නායක මුදියන්සේලාගේ කිරිබන්ඩා | පොල්වත්ත | 0 1 22 |
| 94 | එම .. | (1) වලගම පදිංචි විරකෝන්මුදියන්සේලාගේ සිරාතු, (2) ගනේගොඩ පදිංචි විරකෝන්මුදියන්සේලාගේ පුංචිරාල, (3) එම රන්මැනිකා, (4) එම පිකිරිමැනිකා, (5) වලගම පදිංචි එදිරිසිංහමුදියන්සේලාගේ නොහොත් බස්නායකමුදියන්සේලාගේ කිරිබන්ඩා | එම | .. 0 1 26 |

තක්සේරු මිල අක්කරයක් රුපියල් 100කට වැඩිනොවන මුදලක් වේ.

මෙකී ඉඩම් ගැන වැඩිදුර තොරතුරු කොල්ලුපිටියේ ඉඩම් බේරුම්කරන නිලධාරීතුමාගෙන්ද, ඒවාගේ සිතියම් කොළඹ සර්වේයර් ජනරල් උන්නාන්සේගෙන්ද ලබාගත හැකිවේ.

මේ 1945ක්වූ ජනවාරි මස 13වෙනි දින බම්බලපිටියේ ඉඩම් පිළිබඳ කොමසාරිස් උන්නාන්සේගේ කන්තෝරුවේදීය.

එච්. ඊ. ජූන්ස්,
ඉඩම් පිළිබඳ කොමසාරිස් උන්නාන්සේ වම්හ.

No. 13,896, S. O.—ඉඩම් නිරවුල්කිරීමේ නිලධාරීතුමා විසින් මෙහි පහත සඳහන්වෙන ආණ්ඩුව සන්තක ඉඩම් ආණ්ඩුවේ නියෝගවල ප්‍රකාරයට මේ 1945ක්වූ මාර්තු මස 16වෙනි දිනවූ සිකුරාදා පෙරවරු 10ට හාහල්ලේ කූඩාරමේදී වෙන්දේසිකර විකුණන්ට හෝ බේරුම්කරදෙන්ට නොහොත් වෙන අනුමතියක් නීතියකරන්ට යෙදෙනවා ඇත. වයඹ දිසාවේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ වැළිබමිලි හත්පත්තුවේ මදුරේ කෝරලේ පිහිටා තිබෙන බිම් කැබලි 2ක්.

ලංකාමැතිමේ මුල් සිතියමේ නො. 839. ගම—අකලගොමුව.

| නො. | ඉඩමේ නම. | ඉල්ලුම්කාරයා හෝ අයිතිකාරකියන්නා. | අන්දම. | මහන, අ. රූ. පැ. |
|---|---|---|---|---|
| 61 | ඉහලගෙදරවත්තේහේන . | (1) දසනායකමුදියන්සේලාගේ තීන්කිරිබන්ඩා, (2) එම එම විසිරි බන්ඩා, (3) එම එම ලොකුබන්ඩා, (4) එම එම මුදියන්සේ, (5) එම එම හීන්බන්ඩා | පොල්වත්ත | 0 2 32 |
| 67 | ඉහලගෙදරවත්තේ හේන, උඩගෙදරහේනගොඩ වටහේන්ගාය | මහවෙල පදිංචි සිංහලපේඩිදුරයාලාගේ අරූමා .. | .. හේන | .. 0 2 11 |

හන්සේරූ මිල අක්කරයක් රුපියල් 100කට වැඩිනොවන මුදලක් වේ.

මෙකී ඉඩම් ගැන වැඩිදුර තොරතුරු කොල්ලුපිටියේ ඉඩම් බේරුම්කරන නිලධාරීතුමාගෙන්ද, ඒවායේ සිතියම් කොළඹ සර්වේයර් ජනරාල් උන්නාන්සේගෙන්ද ලබාගත හැකිවේ.

මේ 1945ක්වූ ජනවාරි මස 13වෙනි දින බම්බලපිටියේ ඉඩම් පිළිබඳ කොමසාරිස් උන්නාන්සේගේ කන්තෝරුවේදීය.

එච්. ඊ. ජූන්ස්,
ඉඩම් පිළිබඳ කොමසාරිස් උන්නාන්සේ වෙනුවට.

---

## ආණ්ඩුවට ඉඩම් ලබාගැනීම සම්බන්ධ දැන්වීම.

ආණ්ඩුවේ කාර්යයක් සඳහා, ඒ නම්:—හෙල්ලිගොඩ සිංහල මිශ්‍ර පාඨශාලාවක් පිණිස මෙහි පහත සඳහන්වෙන ඉඩම් ලබාගැනීම සඳහා ක්‍රියාකරණ පිණිස "(Cap. 203) ඉඩම් ලබාගැනීමේ ආඥාපත්‍රයේ" පස්වෙනි කාණ්ඩයේ සඳහන්වෙන පංගුවල ප්‍රකාරයට උතුමාණන්වහන්සේගේ කැමැත්ත පිට පලාත් ආණ්ඩුකාරක සභාවෙන් නියමකාර ලෙස අණ ලැබී තිබේ, ඒ ඉඩම නම්:—

සිතියමේ නො. A 942. ගම—බෙන්තොට වලල්ලාවිටි කෝරලේ හෙල්ලිගොඩ.

| නො. | ඉඩමේ නම. | අන්දම. | අයිතිකාරකියන්නා. | මහන; අ. රූ. පැ. |
|---|---|---|---|---|
| 1 | වැලබොඩවත්ත නොහොත් සුදුහේන්ගෙදරවත්ත | අවුරුදු 24 පොල්ගස් 25ක්ද, අවුරුදු 15 කොස් ගස් 9ක්ද, අවුරුදු 5 පුවක්ගසක්ද අවුරුදු 10 දෙල්ගසක්ද, අවුරුදු 7 දොඩම්ගස් 2ක්ද, හුනුබැම්මෙන් බැඳපු උළු සෙවිලිකරනලද සෙක්ල ගොඩනැගිල්ලක් සහ සිමෙන්ති බැම්මෙ : බැඳපු වැසිකිලියක්ද ඇති ඉඩම | හෙල්ලිගොඩ පදිංචි සුමතුවා දොන් අර්නොලිස් ද සිල්වා | 0 2 23·5 |

එබැවින් ඉඩම අයිතිකරගැනීමට ආණ්ඩුවේ කල්පනාව තිබෙන බව පොදුජනයාට දැනගැන්ම සඳහා හයවෙනි වගන්තියේ ඕනෑකර තිබෙන හැටියට මෙයින් දන්නුම්දෙමි.

ඉහතකී ඉඩමට අයිතිවාසිකම් ඇත්තාවූ සෑමදෙනම තමුන්ම නොහොත් තමුන් වෙනුවට ක්‍රියාකරණ අය මේ 1945ක්වූ පෙබරවාරි මස 19වෙනි දින පෙරවරු 11ගේ කාලයට බෙන්තර තානායමේදී මා ඉදිරිපිටට පැමිණ ඒ කොයි අන්දමේ අයිතිවාසිකම්ද කියා කියාසිටින්ට ඕනෑවා සහ මෙම ඉඩම වෙනුවට ඉල්ලා සිටින මුදල් ගණනත් ඊට ඇත්තාවූ තමුන්ගේ අයිතිකමේ තොරතුරුත් කියාසිටින්ට ඕනෑ බව මෙයින් දැනගත යුතුයි.

මේ 1945ක්වූ ජනවාරි මස 12වෙනි දින ගාල්ලේ කච්චේරියේදීය.

සී. වී. පෙරේරා,
ආණ්ඩුවේ උප ඒජන්ත වෙනුවට.

---

203වෙනි පරිච්ඡේදයේ ඉඩම් ලබාගැනීමේ ආඥාපත්‍රයේ හයවෙනි වගන්තියේ ප්‍රකාරයට ආණ්ඩුවේ කාර්යයක් සඳහා, ඒ නම්:—කුම්බුරුප්පිඩියේ වෝර්ඩ් නො. 5 ප්‍රධාන ගඟගැහාපාරේ සිට සාරච්චියට යන පාර වැඩිදියුණුකිරීම පිණිස මෙහි පහත සඳහන්වෙන ඉඩම් ලබාගැනීම සඳහා ක්‍රියාකරණ පිණිස "203 වෙනි පරිච්ඡේදයේ ඉඩම් ලබාගැනීමේ ආඥාපත්‍රයේ" හයවෙනි කාණ්ඩයේ සඳහන්වෙන පංගුවල ප්‍රකාරයට උතුමාණන්වහන්සේගේ කැමැත්ත පිට පලාත් ආණ්ඩු සභා පාලක කාරක සභාවෙන් නියමකාර ලෙස අණ ලැබී තිබේ, ඒ ඉඩම් නම්:—

මුල් සිතියමේ නො. A 716. ගම—කුම්බුරුප්පිඩි.

| නො. | ඉඩමේ නම. | අන්දම. | අයිතිකාරකියන්නා. | මහන, අ. රූ. පැ. |
|---|---|---|---|---|
| 1 | අක්කම්මාවලවු .. | පාලු ඉඩමක් .. | ඇස්. සවුන්දරිපිල්ලේ .. .. | 0 0 0·8 |
| 2 | පුලියඩිවලවු .. | එම .. | නිලාවලියේ ඇස්. සෙල්ලයියා .. .. | 0 0 3·8 |
| 3 | වෙම්බාඩිවලවු .. | එම .. | ඇන්. කෝනමලේ .. .. .. | 0 0 0·1 |
| 4 | සින්නකෝවම් .. | එම .. | සින්නපිල්ලේ, මුරුගපිල්ලේගේ වැන්දඹු ස්ත්‍රිය .. | 0 0 0·2 |
| 5 | අප්පවලවු .. | එම .. | වී. කාතිකිසුපිල්ලේ .. .. .. | 0 0 12·3 |
| 6 | පිල්ලෙයාර්කෝවිල් . | එම .. | තංගපිල්ලේ, ඇස්. කනගසබේගේ වැන්දඹු ස්ත්‍රිය .. | 0 0 0·6 |
| 7 | අප්පාවලවු .. | පාලු ඉඩමක් සහ අවුරුදු 20–25 වයසැති පොල්ගස් 5ක් සහ කොහොඹකොට 2ක්ද තිබෙන වත්තක් | වී. නල්ලලිංගම්, වී. කදිරවේලුපිල්ලේ සහ වී. සෙල්ලරාජ් | 0 0 11·9 |
| 8 | පරියාරිවලවු .. | පාලු ඉඩමක් .. | වී. කාතිගිසුපිල්ලේ .. .. .. | 0 0 1·5 |
| 9 | සෙල්ලප්පර්වලවු .. | වයස අවුරුදු 30කට වැඩි ඇති පොල්ගස් 1ක් සහ තල්ගසක් තිබෙන වත්තක් | වල්ලිපිල්ලේ, වී. සෙල්ලප්පාගේ වැන්දඹු ස්ත්‍රිය .. | 0 0 4·8 |
| 10 | පරියාර්වලවු .. | පාලු ඉඩමක් .. | වී. කාතිගිසු, කනගබේ, ඒ. මීස්වලිංගම්ගේ ස්ත්‍රිය, කේ. රාසම්මා, වේලුපිල්ලේගේ ස්ත්‍රිය, එදිරිමානසිංහම්, කේ. පොන්නාදුරේ, සෙල්ලම්මා, සන්මුගම්ගේ ස්ත්‍රිය, සෙල්ලනාච්චියා සහ කේ. සුබ්‍රමනියම් | 0 0 1·7 |
| 11 | කුරවනර්වෙල් .. | එම .. | කේ. එදිරිමානසිංහම් .. .. | 0 0 6·6 |
| 12 | කරච්චිකාවු .. | එම .. | වී. ගුණසේකරම් .. .. .. | 0 0 1 |

එබැවින් ඉඩම අයිතිකරගැනීමට ආණ්ඩුවේ කල්පනාව තිබෙන බව පොදුජනයාට දැනගැන්ම සඳහා හයවෙනි වගන්තියේ ඕනෑකර තිබෙන හැටියට මෙයින් දන්නුම්දෙමි.

ඉහතකී ඉඩම්වලට අයිතිවාසිකම් ඇත්තාවූ සෑමදෙනම තමුන්ම නොහොත් තමුන් වෙනුවට ක්‍රියාකරණ අය මේ 1945ක්වූ පෙබරවාරි මස 10වෙනි දින උදේ 10ගේ කාලයට කුම්බුරුපිඩියේ පාඨශාලාවේදී මා ඉදිරිපිටට පැමිණ ඒ කොයි අන්දමේ අයිතිවාසිකම්ද කියා කියාසිටින්ට ඕනෑවා සහ මෙම ඉඩම් වෙනුවට ඉල්ලාසිටින මුදල් ගණනත් ඊට ඇත්තාවූ තමුන්ගේ අයිතිකමේ තොරතුරුත් කියාසිටින්ට ඕනෑ බව මෙයින් දැනගත යුතුයි.

මේ 1945ක්වූ ජනවාරි මස 13වෙනි දින ත්‍රිකුණාමලේ කච්චේරියේදීය.

ආර්. එච්. බී. මැන්ඩර්ස්,
ආණ්ඩුවේ උප ඒජන්ත වෙනුවට.

වම් 1876ක්වූ අවුරුද්දේ නොම්බර 3කේ ආඥාපත්‍රයේ හත්වෙනි වගන්තියේ ප්‍රකාරයට, ආණ්ඩුවේ කාර්‍ය්‍යසත්තකව, එනම්:— වැල්ලවායේ ආරෝග්‍යශාලාවක් ඉදිකිරීම පිණිස මෙහි පහත සඳහන්වෙන ඉඩම් ලබාගැණීම සඳහා ක්‍රියාකරන පිණිස "වම් 1876යේ ඉඩම් ලබාගැනීමේ ආඥාපත්‍රයේ" නමැති කාණ්ඩයේ කරතිබෙන පංගාර්තුවල ප්‍රකාරයට උතුමාණන්වහන්සේගෙන් නියමකාර මට අණ ලැබී තිබේ, ඒ ඉඩම්නම්:—

මුල් සිතියමේ නො. A 207. ගම—මල්අත්තාවල.

| නො. | ඉඩමේ නම. | අන්දම. | අයිතිකාරයින්ගේ නම්. | මහත, අ. රූ. ප. |
|---|---|---|---|---|
| 1 | මල්අත්තේහේන | හේන | වැල්ලවායේ ඒ. බී. ඇස්. විජේසිංහ මහතා | 4 3 14·4 |
| 2 | එම | එම | එම | 0 0 11·8 |

එබැවින් ඉඩම් අයිතිකාරයින්ට ආණ්ඩුවේ කල්පනාව තිබෙන මේ උපාදුර්ජනයට දුනගැන්ම සඳහා හත්වෙනි වගන්තියේ නියමකර තිබෙන හැටියට මෙයින් දැනුම්දෙමි.

ඉහතකී ඉඩම්වලට අයිතිවාසිකම් ඇත්තාවූ සෑම්දෙනාම තමුන්ම හෝ නොහොත් තමුන් වෙනුවට ක්‍රියාකරන අය වම් 1945ක්වූ පෙබරවාරි මස 14වෙනි දින පෙරවරු 10යේ කාලසමයට බදුරේ කච්චේරියේදී මා ඉදිරිපිට පැමිණ ඒ කොයි අන්දමේ අයිතිවාසිකමද කියා කියාසිටින්ම ඕනෑවා සහ මෙම ඉඩම් වෙනුවට ඉල්ලාසිටින මුදල් ගණනත් ඒව ඇත්තාවූ තමුන්ගේ අයිතිකමේ තොරතුරුත් කියාසිටින්ට ඕනෑ බව මෙයින් දැනගත යුතුයි.

වම් 1945ක්වූ ජනවාරි මස 11වෙනි දින
බදුරේ කච්චේරියේදීය.

ඇම්. ප්‍රසාඩ්,
ඌවේ ආණ්ඩුවේ ඒජන්ත වමියා.

---

## රජසන්තක රබර් ඉඩම් බදුදීම.

L. W. 5575

සබරගමු පලාතේ රත්නපුර දිස්ත්‍රික්කුවේ පිහිටි මෙහි පහත සඳහන් රජසන්තක රබර් ඉඩම්වල 1945යේ සිට 1949යේ දෙසැම්බර් මස 31වෙනි දින දක්වා කිරිකපා ප්‍රයෝජනගැනීමේ බලය ඉල්ලා එවන්ට යෙදෙන ඉල්ලුම්පත්‍ර සබරගමු පලාතේ ආණ්ඩුවේ ඒජන්ත උන්නාන්සේ විසින් බාරගනු ලැබේ. මෙම ඉඩම් ආණ්ඩුව විසින් රෙජිස්ටර්කර තිබේ.

2. "Tenders for the right to take the produce of rubber trees" එනම් "රබර්ගස්වල කිරිකපා ප්‍රයෝජන ගැණීමට බලය ඉල්ලුම්කරන ඉල්ලුම්පත්‍රය" යන වචන ඇන්විලොප් එකේ මතුපිට ලියනලද මුද්‍රලත් ඉල්ලුම්පත්‍ර වම් 1945ක්වූ පෙබරවාරි මස 6වෙනි දින පෙරවරු 10 වනතුරු බාරගෙන කඩාබලනවා ඇත. ඉල්ලුම්කාරයෝ ඉදිරිපිට සිටින්ට ඕනෑය. එසේ නැත්නම් නිසි බලයලත් ඒජන්ත කෙනෙක් හෝ ඒජන්තවරු ලවා ඉල්ලුම්පත්‍ර හරි ඒවා බව ඔප්පුකරන්ට ඕනෑය. එක එක ඉඩමට වෙන් වෙන්ව ඉල්ලුම්පත්‍ර එවන්ට ඕනෑය.

3. යම් ඉල්ලුම්පත්‍රයක් බාරගැනීමේ හෝ නොගැනීමේ බලය ඒජන්තතුමා වෙත තබාගන්නාලදී.

4. ඒජන්තතුමා විසින් භාරගන්නාලද ඉල්ලුම්පත්‍ර අයිතිකාරයෝ ඉල්ලුම්පත්‍රවල සඳහන් මුදලෙන් 1/5 කොටසක් එවලේම ගෙවන්ට ඕනෑය. ඉතුරු මුදල් සම කොටස්වලින් 1946යේ, 1947යේ, 1948යේ, 1949යේ ජනවාරි 1වෙනිදාසිට ප්‍රථම ගෙවන්ට ඕනෑය.

5. කැලෑවට යන්ටනොදී ඉඩම හොඳ අන්දමින් තබාගැනීමට බදුකාරයා වගකිය යුතුය.

6. උවමනාකරණ කානු සහ වලවල් ආදිය කපා ඉඩමේ පස් සෝදායාම වැලැක්විය යුතුය.

7. බද්ද අවසානවූ වහාම හෝ අවලංගුකලවිට බදුකාරයා වගාවට අනතුරු නොකර ඉඩම නිරවුල්ව භාරදිය යුතුයි.

8. කුපන්දීම සඳහා කාරනා රබර් පාලකතුමාගෙන් දැනගත යුතුයි.

9. රබර් පාලකතුමා විසින් නියමකලහොත් ඉඩම් පරීක්ෂා කිරීමට සහ සාක්ෂේරුකිරීමට යන මුදලක් බදුකාරයා විසින් ගෙවිය යුතුය.

10. වැඩිදුර කාරනා සබරගමු පලාතේ ඒජන්තතුමාගෙන් ලබාගත හැක.

බී. මහසුතුර,
සබරගමු පලාතේ මහා ඒජන්තතුමා වෙනුවට.

වම් 1945ක්වූ ජනවාරි මස 12වෙනි දින
රත්නපුරේ කච්චේරියේදීය.

| නො. | රෙජිස්ටර් නො. | ඉඩම්වල විස්තර. | සීමතරම, අ. | රූ. | ප. |
|---|---|---|---|---|---|
| | | **කුරුවිටිකෝරලය.** | | | |
| | | **F. V. P. 331. ගම—දෙහිපගල.** | | | |
| 1 | 160S1R39 | 50F, 65G | 0 | 2 | 21 |
| | | **V. P. 660. ගම—මිට්ගෙලගම.** | | | |
| 2 | — | 43 | 6 | 1 | 33 |
| | | **F. V. P. 391. ගම—මුරුත්තෙව්වූකන්ද.** | | | |
| 3 | 161S1R4 | 3 (කොටසක්) | 1 | 2 | 0 |
| | | **F. V. P. 347. ගම—වෙරළුප්පෙ.** | | | |
| 4 | 152S1R55 | 48A | 2 | 3 | 14 |
| | | **F. V. P. 328. ගම—පාතලස්සෙකන්ද.** | | | |
| 5 | 161S1R114 | 33 (කොටසක්) | 0 | 2 | 0 |
| | | **F. V. P. 355. ගම—ඔටකොට.** | | | |
| 6 | — | 106A, 106C, 109A, 127A, 127B, 127C, 127D, 130A, 130F, 131A, 131B, සහ 131E | 2 | 3 | 27 |
| 7 | — | 127E | 0 | 1 | 4 |
| | | **V. P 384. ගම—අතුරෙලිය.** | | | |
| 8 | — | 19A | 0 | 0 | 25 |
| | | **F. V. P. 182. ගම—කිරිඇල්ල.** | | | |
| 9 | — | 25K, 41AK, 41W | 0 | 1 | 11 |
| | | **නවදුන්කෝරලය.** | | | |
| | | **V. P. 410. ගම—හල්වැල්ල.** | | | |
| 10 | 164S1R22 | 53 | 0 | 0 | 8 |
| | | **F. V. P. 39. ගම—කරවිට.** | | | |
| 11 | — | 121, 122, 124 (කොටස්) | 1 | 0 | 0 |
| | | **අටකලන්කෝරලය.** | | | |
| | | **V. P. 613. ගම—කොස්වල.** | | | |
| 12 | 251S5R30 | 81 (කොටසක්) | 0 | 2 | 0 |
| | | **F. V. P. 222. ගම—ගඹෙඩල.** | | | |
| 13 | 226S5R34 | 140 සහ 158V (කොටස්) | 0 | 1 | 0 |
| | | **කුකුළුකෝරලය.** | | | |
| | | **V. P. 41. ගම—ගවරගිරිය.** | | | |
| 14 | .. | 462 | 0 | 0 | 35 |
| 15 | 192S3R245 | 395 | 0 | 0 | 22 |
| 16 | 192S3R231 | 589J2 | 0 | 0 | 15 |
| 17 | 192S3R233 | 580 | 0 | 1 | 29 |
| | | **F. V. P. 251. ගම—ලේකම්ගොඩ.** | | | |
| 18 | 195E3R37 | ලොට් 334, 33I | 10 | 2 | 33 |
| | | **F. V. P. 243. ගම—පෙජ්ඩිකන්ද.** | | | |
| 19 | 196S3R88 | 74 (කොටසක්) | 0 | 0 | 15 |
| 20 | 196S3R95 | 30AK (කොටසක්) | 14 | 0 | 21 |
| | | **F. V. P. 42. ගම—අයගම.** | | | |
| 21 | 193S3R195 | 145B, 145A, 160B, 171D | 5 | 0 | 7 |
| 22 | 193S3R235 | 243A | 0 | 1 | 4 |
| 23 | 193S3R200 | 541D | 1 | 1 | 11 |
| 24 | 193S3R243 | 510 5/1H | 2 | 2 | 19 |
| 25 | 193S3R247 | 470 | 1 | 1 | 27 |
| 26 | 193E3R42 | 56 (කොටසක්) | 14 | 0 | 7 |
| 27 | 193E3R48 | 681 (කොටසක්) | 10 | 0 | 0 |
| 28 | 193S3R244 | 470B, 395AY | 0 | 1 | 2 |
| | | **F. V. P. 241. ගම—මිහිර.** | | | |
| 29 | 194S3R165 | 109 | 3 | 1 | 1 |
| 30 | 194S3R150 | 131M | 0 | 0 | 14 |
| 31 | 194S3R169 | 136A, 133E | 1 | 0 | 4 |
| | | **F. V. P. 240. ගම—ගෙදහල.** | | | |
| 32 | 194S3R131 | 31A | 0 | 0 | 18 |
| 33 | 194S3R135 | 4I, 4J | 0 | 0 | 21 |
| | | **F. V. P. 254. ගම—වරකාපල්ගොඩ.** | | | |
| 34 | 195S3R138 | 84S | 0 | 1 | 31 |

## 1939යේ නො. 61 දරණ නගර සභා ආඥාපණත යටතේ සාමාජිකයින් තේරීමේ දැන්වීම.

### කුලියාපිටියේ පළාත් ආණ්ඩු සභාවේ නොම්මර 1වෙනි කනදුල්ල කොට්ඨාශයට මන්ත්‍රී කෙනෙකු තේරීමයි.

නොම්මර එකේ කනදුල්ල කොට්ඨාශයට නියමිතව සිටි තෝරා පත්කරගන්නාලද මන්ත්‍රීවරයාවූ සී. ඒ. රත්නායක මහත්මයා විසින් 1939යේ නොම්මර 1 දරණ පළාත් ආණ්ඩු සභා ආඥාපණතේ 18 (1) වගන්තිය යටතේ එකී තනතුරෙන් අස්වූයෙන් යටකී ආඥාපණතේ 10වෙනි වගන්තිය යටතේ 1940යේ නොම්මර 14 දරණ සහ 1942යේ නොම්මර 3 දරණ සංශෝධිත ආඥාපණත යටතේ යථෝක්ත පුරප්පාඩුවට මන්ත්‍රී කෙනෙක් තෝරාගැනීම සඳහා වූ 1945යේ මාර්තු මස 2වෙනි සිකුරාදා අතුරු මන්ත්‍රීන් තේරීමක්, ඉහත සඳහන් 1939යේ නොම්මර 61 දරණ ආඥාපණතේ 18 (3) අතුරු වගන්තිය යටතේ, පවත්වන බව මෙයින් දැනුම්දෙනු ලැබේ.

2. සෑම ඉල්ලුම්කරුවෙකුගේම නාම ලියාපදිංචිකිරීම පිණිස නාමයෝජනාපත්‍ර එකක් හෝ වැඩි ගණනක් භාරදිය යුතුයි. (අ) එම නාමයෝජනාපත්‍ර කනදුල්ල කොට්ඨාශයේ ලියාපදිංචි කරණලද ඡන්දදායකයින් ඉතා අඩුගණනේ දෙදෙනෙකුවත් අත්සන්කළ යුතුයි. (ආ) තවද එම නාමයෝජනාපත්‍රයේ හෝ ඊට යාකරණලද ලියමනක එසේ ඉදිරිපත්වීමට සතුටුබව හඟවා ඉල්ලුම්කරු විසින් අත්සන් තැබිය යුතුයි.

එම නාමයෝජනාපත්‍ර ඒ සඳහා නියමිත දිනය වන 1945යේ මාර්තු මස 2වෙනිදා පෙරවරු 10ටත් 11ටත් අතර කාලය තුළ මෙහි පහත අත්සන්කරන මා වෙත කුලියාපිටියේ පළාත් ආණ්ඩු සභා කාර්යාලයේදී භාරදිය යුතුයි.

තවද 1945යේ මාර්තු මස 2වෙනි දින පෙරවරු 11ට ප්‍රථම යම් ඉල්ලුම්කරුවෙකු විසින් රුපියල් සියය (Rs. 100)ක ඇපයක් මා වෙත තැන්පත්නොකළොත් ඔහුගේ ඉල්ලුම්පත්‍රය ප්‍රතික්ෂෙප කරණු ලැබේ.

තවද එකී කොට්ඨාශයට එක ඉල්ලුම්කරුවෙකුට වැඩි ගණනක් ඉදිරිපත් වූවොත් 1945යේ මාර්තු මස 16වෙනි දින කුලියාපිටියේ අයිනව නානා ශාලාවේදී (නිව් තියටර් හෝල්) ඡන්දය විමසීමක් පවත්වනු ලැබේ. ඡන්දය විමසීම උදේ 8 සිට 12 වනතුරුද, නැවත පස්වරු 1.30 සිට 4 වනතුරුද පවත්වනු ලැබේ.

ඇන්. ඊ. අර්න්ස්ට්,
වයඹ දිසාවේ ආණ්ඩුවේ මහ ඒජන්ත උන්නාන්සේ.

1945ක්වූ ජනවාරි මස 16වෙනි දින
කුරුණෑගල කච්චේරියේදීය.

## දැන්වීමයි.

### කුරුණෑගල දිස්ත්‍රික්කයේ කෝළ මැඩීම.

ආරක්ෂා (මිශ්‍ර) අණපනත්වල 37වෙනි වගන්තිය යටතේ 1943 ආරක්ෂා වී කොටිකෑන පිළිබඳ අණපනත් යටතේද මෙසේ නියමකරමි.

1. (අ) කුරුණෑගල දිස්ත්‍රික්කයට අයත් වන්නි, දේවමැදි හත්පත්තුවල සියලු ගොඩ සහ මඩ කුඹුරු හිමියන් විසින් 1944–45 මාස් කන්නයේ කොළ පෑගීමට පෙර ඒ ඒ කොට්ඨාශවල වෙල් මූලාදෑනියාට හෝ මා විසින් ලියවිල්ලකින් බලයදෙනලද නිලධාරීයෙකුට දින 10කට ප්‍රථම දැන්විය යුතුයි.

(ආ) ඉහතකී පරිදි කිසිවෙක් එකම ප්‍රධාන මූලාදෑනිතැනගේ කොට්ඨාශය ඇතුලත සිරිත් ප්‍රකාර තැන්පත්කර තබන තැනකට හෝ අටුවකට පහත දැක්වෙන කරුණු සම්පූර්ණකරණ තුරු කමතේ සිට වී නොගෙන යා යුතුයි:—

(i) මා විසින් ලියවිල්ලකින් බලය දෙනලද අයකු හෝ වෙල් මූලාදෑනියා විසින් අස්වැන්න ගණන්ගන්නා තුරුද,

(ii) ඉහතකී මූලාදෑනින් විසින් ලියවිල්ලකින් අවසරයක් දුන් විටකද,

(iii) ආණ්ඩුවට දියයුතු, අක්කරයකට වී බුසල් දෙක බැගින් පළමුවෙන් අයකරනු ලබන අක්කර බද්ද හැර මෙනත් වැඩිපුර වීද මා විසින් ලියවිල්ලකින් බලය දෙනලද ඉහතකී නිලධාරීයෙකුට භාරදුන් පසුවද.

2. එකම ප්‍රධාන මූලාදෑනිතැනගේ කොට්ඨාශයෙන් පිට වෙන ප්‍රධාන මූලාදෑනියෙකුගේ කොට්ඨාශයකට ඉහතකී වී ගෙනයෑමට අදහස්කරණ යම් අයෙක් මගෙන් හෝ ම විසින් හිමි බලය දෙනු ලැබූ නිලධාරියෙකුගෙන් අවසර ලබාගත යුතුයි.

සී. ආර්. බී. සී. කැස්පර්ස්,
හදිසි කටයුතු භාර උප ඒජන්තතැන,
වාරියපොල කොට්ඨාශය.

වම් 1945ක්වූ ජනවාරි මස 12වෙනි දින
කුරුණෑගල (හ) කච්චේරියේදීය.

PRINTED AT THE CEYLON GOVERNMENT PRESS, COLOMBO.